**ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලය - 2022**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන මණ්ඩලයේ ("මණ්ඩලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර තැන්පතු 05 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාළ විය යුතු පොලී ආදායම රු. 817,375 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | මෙම ස්ථාවර තැන්පතුවලට අදාල පොලිය මාසික පදනමින් ගණනය කර ඇති බැවින් මසකට වඩා අඩු දින කිහිපයකට පමණක් අදාල පොළිය මෙමගින් පෙන්නුම් කර ඇත. 2023 වර්ෂයේ ගිණුම් සමඟ මෙය නිවැරදි කරන බවට සටහන් කර ගනිමි. | කාල පරිච්ඡේදයට අදාලව සියළු ආදායම් ගිණුම්ගත කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 සහ 2021 වර්ෂයන්හීදී ආයතන 16 කට අදාලව ඉන්වොයිස් කරන ලද එකතු අගය රු. 1,288,324 ක් වූ ණයගැතියන් විධිමත් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත අනුව ආදායමක් හඳුනාගත හැකි අවස්ථාව වන විට එය ගිණුම්ගත කල යුතු බැවින් 2021 වර්ෂයේදී මෙම ආදායම් සැලකිල්ලට ගෙන ඇත. එහෙත් ඊට පසුව ඇති වූ සිදුවීම් නිසා 2022 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී එම ලැබිය යුතු ආදායම්වල සැබෑ තත්ත්වය පෙන්නුම් කිරීමට සිදුවිය. ඒ අනුව ආදායමක් ජනිත නොවේ යැයි පිළිගත හැකි සාක්ෂි සමඟ ඇති ඉන්වොයිස් සමුච්චිත අරමුදලට එරෙහිව කපා හරින ලදී. ඉදිරියේදී පාලක සභාවේ අනුමැතියද සමග මෙය සිදුකරන බවට සටහන් කර ගනිමි. | පසුගිය වර්ෂවලට අදාල නිවැරදි නොවන ගිණුම් සටහන් වුවද ඉවත් කිරීමේදී විධිමත් අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 හා 2021 වර්ෂයට අදාලව නිකුත්කරන ලද ඉන්වොයිස් 16 කින් ලැබිය යුතු රු. 966,420 ක් වූ ආදායම්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වරද ඉදිරියේදී නොවීමට අවශ්‍ය කටයුතු සිදුකලෙමි. | ලැබිය යුතු දැ අය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර 04 කට වැඩි කාලයක සිට පැවත එන වටිනාකම රු. 175,959 ක් වූ එකතු කිරීමේ අගය මත බදු මුදල් (VAT) හා රු. 32,558 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් (NBT) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය සම්බන්ධව සිදුකල ඉල්ලීම් වෙනුවෙන් ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නැත. PED/01/2021(I) චක්‍රලේඛයට අනුව විගණන කමිටුවේ නිර්දේශයද සහිතව පාලක සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් පසුව කපා හැරීමට සටහන් කර ගතිමි. | ලැබිය යුතු දැ අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් විගණන දිනය වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික වාර්තාවේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 41,895,359 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 14,524,699 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 27,370,660 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි වියදම රු. 3,459,575 කින් හා ගිවිසුම්ගත සේවා සඳහා වන වියදම් රු. 4,958,810 කින් වැඩි වී තිබූ නමුත් වර්ෂයේ ආදායම රු. 33,355,969 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරීක්ෂාවට ලක් කරන ලද 2020-2022 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ප්‍රතිතන සහතික ලබා ගැනීම | අයදුම්පතක් ලැබුණු පමණින් ප්‍රතීතනය ලබා දිය නොහැක. අදාල ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට ප්‍රතීතන අදියරයන් කිහිපයක් ඇත. එම | මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සුදුසු පාලන ක්‍රම |

| | | |
|---|---|---|
| වෙනුවෙන් මණ්ඩලය වෙත අයදුම්පත් 74ක් ලැබී තිබුණු අතර අයදුම්පත් 16ක් සඳහා සහතික ලබා දීමට මණ්ඩලයට මාස 14 ක සිට මාස 34 ක් අතර කාල පරාසයක් ගතකර තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් සහතික නිකුත් කර නොතිබුණු අයදුම්පත් සංඛ්‍යාව 13ක් විය. | පියවරවල් අතර අදාල ඉල්ලුම් කල ආයතන කළ යුතු නිවැරදි කිරීම් කර අප ආයතනය වෙත බාර දිය යුතුය. එම ක්‍රියාවලියේ ප්‍රමාදයක් සිදුවූ හෙයින් ප්‍රතීතන ප්‍රදානයද ප්‍රමාද වී ඇත.<br>ඊට අමතරව කොවිඩ් වසංගතය දැඩිව පැවති වකවානුවක් හේතුවෙන් එයද මෙම ප්‍රමාදයට බලපෑමක් සිදු කලේය. | යොදා එම කටයුතු ඉටුකල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මණ්ඩලය විසින් 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සම්පූර්ණ ක්‍රියාකාරකම් 167 ක් නිරූපණය වූ අතර, ඉන් ක්‍රියාකාරකම් 30 ක් සඳහා පමණක් මූල්‍ය ඉලක්කයන් ලබා දී තිබුණි. මූල්‍ය ඉලක්කයන් ලබා දී තිබූ එකතු වටිනාකම රු.823,000ක් වූ ක්‍රියාකාරකම් 10ක හා මූල්‍ය වටිනාකම ඉදිරිපත් කර නොතිබූ ක්‍රියාකාරකම් 45 ක අපේක්ෂිත ප්‍රගතිය ලගාකරගෙන නොතිබුණි. | 2024 වාර්ෂික සැලැස්ම සකස් කරන විට හැකි සෑම ක්‍රියාකාරකමක් සඳහාම මූල්‍ය වටිනාකමක් ඇතුලත් කිරීමට සටහන් කරගතිමි. එසේ වුවද සමහර ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ඉලක්ක ලබා දීම සැමවිටම ප්‍රායෝගික නොවේ. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගතිය මැනිය හැකි පරිදි නිෂ්චිත ඉලක්කයන් සහිතවද, අපේක්ෂිත පිරිවැය සහිතවද සකස්කළ යුතුය. |